11)

# පාසල හා පංචශීලය පාදක

# සදාචාර අධ්‍යාපනය

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති ( M.Phil )

උපාධිය ( කොටසක් සම්පූර්ණ කිරීම ) සඳහා

ඉදිරිපත් කරන නිබන්ධය

කර්තෘ : තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමි.

( අධ්‍යාපනවේදී )

අධ්‍යාපන පීඨය

කොළඹ විශ්ව විද්‍යාලය

1981 ඔක්තෝම්බර් 14

PERMANENT REFERENCE NOT TO BE REMOVED FROM THE LIBRARY

UCLIB
378051

## සා රා ං ශ ය

" පාසල හා පංචශීලය පාදක සදාචාර අධ්‍යාපනය " යන මැයින් කෙරෙන මෙම පර්යේෂණයේ දී බුදුරජාණන් වහන්සේ විසින් නව චින්තන රටාවක් සඳහා පෙළ ගස්වන ලද පංචශීල සංකල්පය පාදක කොට ගනිමින් පාසල තුළින් සදාචාර අධ්‍යාපනයක් ගොඩ නැංවීමේ ක්‍රියාවලිය විග්‍රහ කිරීම මෙහි අරමුණ වේ. මේ අරමුණ යටතේ යථෝක්ත මාතෘකාව විග්‍රහයට භාජන කිරීමේ දී පියවර කිහිපයක් ම ඉදිරිපත් වෙයි.

මෙහි පළමුවන පරිච්ඡේදයේ දී ත්‍රිපිටක හා බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රයන්ට ප්‍රමුඛත්වය හිමි වේ. ඒ මගින් බුදුරජාණන් වහන්සේ විසින් නව අර්ථ කථනයක් යටතේ පෙන්නුම් කරනු ලැබූ පංචශීල සංකල්පය පිළිබඳ විශ්ලේෂණ ක්‍රියාවලිය ආරම්භ වෙයි. දෙවන පරිච්ඡේදයේ අරමුණ වී ඇත්තේ යථෝක්ත සංකල්පයේ සනාතනික හා සර්වකාලීන වටිනාකම ප්‍රමාණ කිරීමට ඓතිහාසික හා දාර්ශනික පසුබිම කෙරෙහි යොමු වීමයි.

පංචශීල සංකල්පය නව චින්තන ක්‍රමයක් තුළින් හඳුන්වා දුන් බුදුරජාණන් වහන්සේ හා උන්වහන්සේගේ උදාර නායක ලක්ෂණත්, නායක ලක්ෂණවලින් හෙබවුණු ශිෂ්‍ය පරපුරක් අපේක්ෂා වීමේ දී පංචශීල ප්‍රතිපදාවේ අදාළතාව අඩංගු සදාචාරාත්මක පදනම විමසීමට ලක් කිරීම තෙවන පරිච්ඡේදයෙන් අපේක්ෂා කර ඇත.

සිව්වන පරිච්ඡේදයෙන් අධ්‍යාපනය හා සදාචාර සංකල්පය අතර පවතින, පැවතිය යුතු සම්බන්ධය විමර්ශනයට ලක් කරමින් පාසල තුළින් සදාචාර අධ්‍යාපනයක් ගොඩ නැංවීමෙහි අවශ්‍යතාව පැහැදිලි කිරීම සඳහා තැත් කිරීම අරමුණු කර ඇත.

පංචශීලය පාදක සදාචාර අධ්‍යාපනය වර්තමාන පාසල කෙරෙහි පෙන්නුම් කරනු ලබන අදාළතාව සාමාන්‍යකරණය කළ හැකි වන පරිදි මෙවැනි පර්යේෂණයක දී විමසීමක් කිරීම අවශ්‍ය වේ. එබැවින් ගම්පහ - කුරුණෑගල -

පොළොන්නරුව යන අධ්‍යාපන දිස්ත්‍රික්කවල අහඹු පදනමක් මත තෝරා ගත් 600 ක ශිෂ්‍ය ( ගැහැණු - පිරිමි ) නියැදියක් සඳහා දෙන ලද බහුවරණ ප්‍රශ්න පත්‍රයට ලැබුණු ප්‍රතිචාරයන්ගෙන් කියැවෙන දත්ත විශ්ලේෂණයට භාජනය කිරීමත්, පංචශීල සංකල්පයෙන් අර්ථවත් වන යහපත් අතට නැඹුරු වූ පස් වැදෑරුම් චර්යා රටාව වර්තමාන ශිෂ්‍ය පරපුර කෙරෙහි දක්වන සාපේක්ෂතාව විමසීමත් පස්වැනි පරිච්ඡේදයේ අපේක්ෂාව වී ඇත.

අවසාන පරිච්ඡේදයේ දී දීර්ඝ ඓතිහාසික පසුබිමක් තුළින් වර්ධනය වෙමින් ආ පංචශීල සංකල්පයෙන් ඉදිරිපත් වන අවිහිංසා මූලධර්මය පාදක කොට ගත් චර්යා රටාවන් කෙරෙහි ආකල්ප වර්ධනය විය යුතු අයුරුත්, ඒ සඳහා සමස්ත සමාජය තුළ පවතින විවිධ කාරකයන් මගින් ගත යුතු ක්‍රියා මාර්ගයන් ආශ්‍රිත යෝජනාවලියක් ඉදිරිපත් වේ.

මෙහි සෑම පියවරකදී ම පාසල නමැති විධිමත් ආයතනය ප්‍රමුඛ වෙයි. අනාගත වගකිව යුතු පුරවැසි පිරිස වර්තමාන ශිෂ්‍ය පරපුර ම වන නිසාත්, පවත්නා ඇතැම් සදාචාරාත්මක පරිහානි ලක්ෂණ ඉවත් කිරීමෙන් නව සමාජයක් නිර්මාණය කිරීමේ ශක්තිය පාසල් ශිෂ්‍ය ප්‍රජාව කෙරෙහි විද්‍යමාන විය යුතු නිසාත් පාසලට හිමි විය යුතු ප්‍රමුඛත්වය අවිවාදයෙන් පිළිගැණෙයි.

මෙම පර්යේෂණය තුළින් ඇතැම් විස්තර වශයෙන් පැහැදිලි විය යුතු කරුණු වැඩි දුරටත් අවධානයට ලක් කිරීමට ඉඩ සලසමින් අවශ්‍ය විස්තර අඩංගු උපග්‍රන්ථයක් කෘතිය අවසානයෙහි යා කොට ඇත.